AEC
Australian Electoral Commission

Sinhalese / සිංහල

# ජනමත විචාරණ

ජනමත විචාරණයක් යනු යෝජිත ව්‍යවස්ථා සංශෝධන ප්‍රශ්ණයක් පිළිබඳ ජාතික චන්ද විමසුමකි. ව්‍යවස්ථාව යනු අපේ රට පාලනය කළයුතු ආකාරය දක්වන මූලික ලියවිල්ලයි. 1901 සිට මේ දක්වා ජනමත විචාරණ 44ක් පවත්වා ඇත. එවැන්නක් පවත්වා දැනට සෑහෙන කාලයක් ගතවී ඇත — 1999දී පැවැත්වූ අවසන් ජනමත විචාරණයෙන් පසු අවුරුදු 20ට වඩා ගතවී ඇත.

## චන්දය ප්‍රකාශ කළයුත්තේ කවුද

අවුරුදු 18ට හා ඊට වැඩි සියලුම ඔස්ට්‍රේලියානු පුරවැසියන් ජනමත විචාරණයකදී චන්දය ප්‍රකාශ කළ යුතුය. ඔබ ලියාපදිංචි වියයුතු අතර පහත දෑ සිදුව ඇත්නම් ඔබේ ලියාපදිංචි තොරතුරු යාවත්කාලීන කළ යුතුය:

- ඔබේ නම හෝ ලිපිනය වෙනස් කළේ නම්
- අවුරුදු 18 ක් වී, හෝ
- ඔස්ට්‍රේලියානු පුරවැසියකු වූයේ නම්.

**aec.gov.au** වෙත පිවිස හෝ ඕනෑම AEC කාර්යාලයකින් ලියාපදිංචි පෝරමයක් ලබාගන්න.

## චන්දය ප්‍රකාශ කළ යුත්තේ කවර විටෙක කොතැනකදීද යන්න

රටපුරා පෙව 8 සහ පව 6 දක්වා විවෘත චන්ද මධ්‍යස්ථාන්හි චන්දය ප්‍රකාශ කිරීම සෙනසුරාදා දිනයක පවැත්වෙනු ඇත.

ජංගම චන්ද විමසීම් කණ්ඩායම්ද මැතිවරණ දිනයට ආසන්න සතිවලදී බොහෝ දුරස්ථ ප්‍රදේශයන් වෙත පැමිණෙනු ඇත.

එදිනට පැමිණිය නොහැකි නම්, පුද්ගලිකව හෝ තැපැල් මගින් වේලාසනින් චන්දය ප්‍රකාශකිරීමට ඔබ සුදුසුකම් ලබනු ඇත.

ජනමත විචාරණය ආසන්නව වැඩිදුර තොරතුරු **aec.gov.au** වෙතින් ලබාගත හැක.

## චන්දය භාවිතාකරන අයුරු

ජනමත විචාරණයකදී චන්දය ප්‍රකාශ කිරීම මැතිවරණයකට වඩා වෙනස්ය. පිරවීමට ඇත්තේ එක් චන්ද පත්‍රිකාවක් පමණකි.

යෝජිත ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳ ප්‍රශ්ණයක් චන්ද පත්‍රිකාවේ සඳහන් වනු ඇත. ඒ සඳහා ඔබ චන්දය ප්‍රකාශ කිරීම සඳහා, අනුමත කරන්නේ නම් ‘yes’, යනුවෙන්ද, අනුමත නොකරන්නේ නම් ‘no’ යනුවෙන්ද සඳහන් කරන්න.

ඡන්ද මධ්‍යස්ථානයේදී, විධිමත් චන්දයක් ප්‍රකාශකරන අයුරු පිළිබඳව සහයවන ලෙසට චන්ද නිලධාරියකු, මිතුරෙකු, හෝ පවුලේ සාමාජිකයකු ගෙන් ඉල්ලාසිටිය හැක.

**ඔබ අතින් වරදක් වුවහොත් කලබල නොවන්න.**
නව චන්ද පත්‍රිකාවක් ලබාගෙන නැවතත් අරඹන්න.



ඡන්ද පත්‍රිකා නියැදිය

ඔබ යෝජිත සංශෝධනය අනුමත කරන්නේ නම් **YES** යනුවෙන් සඳහන් කරන්න

නැතහොත්



ඡන්ද පත්‍රිකා නියැදිය

ඔබ යෝජිත සංශෝධනය අනුමත නොකරන්නේ නම් **NO** යනුවෙන් සඳහන් කරන්න

ඔබේ ප්‍රතිචාරය ඉංග්‍රීසියෙන් සඳහන් කළ යුතුය

## ප්‍රතිඵලය තීරණය කෙරෙන අයුරු

යෝජිත ව්‍යවස්ථා සංශෝධනය 'ද්විගුණ බහුතරයකින්“ (double majority) සම්මත විය යුතුය - එනම්:

- සියලු ප්‍රාන්ත සහ ටෙරිටරිවල ප්‍රකාශිත විධිමත් ඡන්ද ප්‍රමාණයෙන් ජාතික බහුතරයක් (50% කට වඩා) සහ
- ප්‍රාන්තවලින් බහුතරයක (අවම වශයෙන් ප්‍රාන්ත හයෙන් හතරක) ප්‍රකාශිත විධිමත් ඡන්ද ප්‍රමාණයෙන් බහුතරයක් (50% කට වඩා)

**ජනමත විචාරණයක් සම්මතවනුයේ එය** | **ජනමත විචාරණයක් සම්මත නොවනුයේ එය**




**ප්‍රතිඵලය බන්ධනීයය.** ඉන් අදහස්වන්නේ ඔස්ට්‍රේලියානු රජය ඡන්දදායකයන්ගේ තීරණය ක්‍රියාත්මක කළයුතු බවයි.

## ජනමත විචාරණ මිථ්‍යා මත දුරලීම

**මිථ්‍යාව:** ජනමත විචාරණයක් ඕනෑම මාතෘකාවක් හෝ නීතියක් සම්බන්ධයෙන් පැවැත්විය හැක.
**සත්‍යය:** ඒවා පවත්වනු ලබන්නේ යෝජිත ව්‍යවස්ථා සංශෝධන සඳහා පමණි.

**මිථ්‍යාව:** 2017 පැවති විවාහ නීති සමීක්ෂණය ජනමත විචාරණයක් හෝ පොදුමත විචාරණයකි.
**සත්‍යය:** එය තැපැල් සමීක්ෂණයක්වූ අතර සහභාගිත්වය අනිවාර්ය නොවීය.

**මිථ්‍යාව:** ජනමත විචාරණයකදී ඡන්දය ප්‍රකාශකිරීම අනිවාර්ය නැත.
**සත්‍යය:** ඔබ ඔස්ට්‍රේලියානුවෙකු හා අවුරුදු 18ක් හෝ ඊට වැඩිනම් ඔබ ඡන්දය ප්‍රකාශ කළයුතුය.

**මිථ්‍යාව:** මා වෙනම ලියාපදිංචි විය යුතුය.
**සත්‍යය:** ඔබ මැතිවරණ සඳහා ලියාපදිංචිවී ඇත්නම්, ඔබ ජනමත විචාරණ සඳහාද ලියාපදිංචිවී ඇත. ඔබේ තොරතුරු යාවත්කාලීනවී ඇති බවට සහතික වන්න.

**මිථ්‍යාව:** මා හට ඡන්දය ප්‍රකාශ කළ හැක්කේ තැපෑලෙන් පමණි.
**සත්‍යය:** ඔබට එදිනම ඡන්දය ප්‍රකාශ කළ හැකි අතර පුද්ගලිකව වේලාසන ඡන්දය ප්‍රකාශකිරීම සඳහා සුදුසුකම් හෝ තැපෑලෙන් ඡන්දය ප්‍රකාශකිරීම සොයාබලන්නට aec.gov.au වෙත පිවිසෙන්න.

**මිථ්‍යාව:** ජනමත විචාරණයකදී ජයලැබීමට 'yes' ඡන්ද 70% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගත යුතුය.
**සත්‍යය:** එය සියලු ප්‍රාන්ත සහ ටෙරිටරිවල ඡන්දදායකයන්ගෙන් 50% කට වැඩි ප්‍රමාණයක් සහ ප්‍රාන්තයන්ගෙන් 50% කට වැඩි ඡන්දදායක ප්‍රමාණයකින් (ප්‍රාන්ත හයෙන් අවම වශයෙන් හතරක) අනුමත වියයුතුය. මෙය 'ද්විගුණ බහුතරය' නම් වේ.

## AEC හි කාර්යභාරය

AEC යනු ස්වාධීන සහ අපක්ෂපාතී ව්‍යවස්ථාපිත අධිකාරියකි.

ජනමත විචාරණයේදී එහි කාර්යභාරය වනුයේ ලියාපදිංචිය, ඡන්දය ප්‍රකාශකිරීම, හා තොරතුරු සේවා සැපයීමයි.

AEC ඔස්ට්‍රේලියානු පවුල් වෙත yes/no පත්‍රිකාවක් බෙදා හැරියද, එහි ඇතුලත් තොරතුරු පාර්ලිමේන්තුව මගින් නිර්මාණය කරන ලද්දකි. පත්‍රිකාව බෙදාහැරීමෙන් ඔබ්බට, AEC හට යෝජිත ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂ හෝ විපක්ෂ ව්‍යාපාරයන් හා කිසිදු සම්බන්ධයක් නැත.

ළඟ එන ජනමත විචාරණයේදී
**මූලාශ්‍ර පිරික්සන්න**

## මූලාශ්‍රය පිළිබඳව නැවතී සැලකිලිමත්වන්න

ජනමත විචාරණයේදී ඔබේ ඡන්දය ඔස්ට්‍රේලියාව සඳහා වැදගත් තීරණයක් ගැනීම උදෙසා උපකාරීවනු ඇත.

ජනමත විචාරණ සමයේදී, ඔබව හිතාමතාම නොමග යවන තොරතුරු ඔබට හමුවනු ඇත.

ඔබ දකින, අසන හෝ කියවන මූලාශ්‍ර පිළිබඳ සළකා බැලීමට නවතින්න, පිරික්සන්න සහ සැළකිලිමත් වන්න. මෙවර ජනමත විචාරණයේදී සාවද්‍ය තොරතුරු හේතුවෙන් නොමග නොයන්න.

මූලාශ්‍ර පිරික්සුම් තොරතුරු සඳහා **aec.gov.au** වෙත පිවිසෙන්න.



කැන්බරාහි, මැතිවරණ කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලදි
Authorised by the Electoral Commissioner, Canberra